4. අතුකෝරාල, දයා රෝහණ, 2013, **සඵලවත් ගුරුවරයෙකු විය හැකි මඟ ධනාත්මක මනෝවිද්‍යා මඟ පෙන්වීමක්**, කොළඹ, ශික්ෂා මන්දිර ප්‍රකාශන
5. අබේපාල, රෝලන්ඩ්, 2013, **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම**, කොට්ටාව, සාර ප්‍රකාශන
6. මලලසේකර, ජී. පී, 2008, **මලලසේකර ඉංග්‍රීසි-සිංහල ශබ්ද කෝෂය**, කොළඹ, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම,
7. ජයවර්ධන, ආනන්ද, ජයවර්ධන, සීතා, 2013, **ඉගැන්වීම් පුහුණුව හා අධීක්ෂණය**, වරකපොල, ආරිය ප්‍රකාශන.
8. කාරියවසම්, සී, **ගුරුවරයා වෘත්තීය තත්වයට පත් කිරීම**, 2007, කොට්ටාව, සාර ප්‍රකාශන.
9. ගුණසේකර, පී. විජේසිරි, **සාර්ථක ගුරුවරයකු හා ඵලදායි විදුහල්පතිවරයකු වීමට**, 1996, නුගේගොඩ, සීමාසහිත දීපානි මුද්‍රණ/ප්‍රකාශන.
10. Minton, David, **Teaching skills in Further & Adult Education**, 1997, Basingstoke, Macmillan Press.


# මහාවිහාරය හා ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය


## පූජ්‍ය දුනුකේඋල්ලේ සාරානන්ද හිමි



The history of Buddhism in Sri Lanka up to the 13th century is to a very large extent the history of Anuradhapura's three great monasteries: the *Mahavihara*, the *Abhayagiri* and the *Jetavana*. Today subscribe to the *Mahavihara's* interpretation of the *Pali Tipitaka*. The Anuradhapura *Maha Viharaya* was an important *Mahavihara* or large Buddhist monastery for Theravada Buddhism in Sri Lanka. It was founded by King *Devanampiya Tissa* of Anuradhapura (247–207 BCE) in his capital city of Anuradhapura. His traditional Theravadin account provided by the Mahavamsa stands in contrast to the writings of the Chinese Buddhist monk Faxian (Ch. Õl>f), who journeyed to India and Sri Lanka in the early 5th century (between 399 and 414 CE). He recorded that the Mahavihara was not only intact, but housed 3000 monks.


ලාංකීය සංස්කෘතික පසුබිමේ ප්‍රථම අගනුවර ලෙස හඳුන්වනුයේ අනුරාධපුර නගරයයි. 'අනුරාධ' නැකැතින් ආරම්භ වූ අනුරාධපුර නගරය ඓතිහාසික වශයෙන්, සංස්කෘතික ම ය වශයෙන් මෙන්ම කලාත්මක වශයෙන් ද සිංහල බෞද්ධයින්ට වැදගත් වූ නගරයකි. ජාතියක් සතු අභිමානවත් ප්‍රෞඪත්වය විස්තර කරනුයේ එරටට අයත් පුරාවිද්‍යාත්මක සාධක සමූහයයි. මේ අනුව ලාංකීය සිහලුන්ගේ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීමේ දී මෙරටට අයත් පුරාවිද්‍යාත්මක සාධක අතුරින් අතිවිශාල සංඛ්‍යාවක් අන්තර්ගතව පවතිනුයේ අනුරාධපුර රාජධානියටයි. උක්ත පුරාවිද්‍යාත්මක සාධකයන් පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මහාවිහාරයට හිමි වනුයේ

---


© ආචාර්ය පූජ්‍ය දුනුකේඋල්ලේ සාරානන්ද හිමි


සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

අතිවිශේෂ ස්ථානයකි. එය ලාංකේය බෞද්ධ සංස්කෘතියේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය වූවා පමණක් නොව ලාංකීය ථෙරවාදී භික්ෂු සමාජයේ හදවත ද විය. මේ හේතු යුක්තින් පදනම් කොටගෙන ගොඩනැගුණු මහාවිහාරය සුවිශේෂ බෞද්ධ මධ්‍යස්ථානයක් විය.

## මහාවිහාරයේ සමාරම්භය

මුටසීව රජු විසින් නිර්මාණය කළ මහමෙවුනා උයන බෞද්ධාගමික ආරාමයක් බවට පරිවර්තනය වීමට ප්‍රථම එය රාජ්‍ය උද්‍යානයක් ලෙස ප්‍රයෝජනයට ගත් කාලයේ වූ සැලැස්ම පිළිබඳ දළ අවබෝධයක් දීපවංශයේ සඳහන් විස්තරයකින් ලබාගත හැකිය.[1] මහින්දාගමනයේ හේතුවෙන් මෙම මූලික සැලැස්ම වෙනස් කිරිමත් එසේම තිබූ සැලැස්මට අවශ්‍යය අංග එකතු කිරීමේ අවශ්‍යතාව තිබෙන්නට ඇත. එසේ වුව ද රාජකීය උද්‍යානයක් වශයෙන් වූ එහි මූලික අංග සමහරක් වෙනස් කිරීමකින් තොරව මෙම දෙවන අදියර සඳහා ප්‍රයෝජනයට ගන්නට ඇතැයි සිතිය හැකිය. ලංකාවේ මුල්ම බෞද්ධ වනෝද්‍යානය ලෙස පරිවර්තනය වූයේ රාජකීය විනෝද උද්‍යානයක් බව මෙහිදී කිසිසේත් අමතක කළ නොහෙකි වේ. කාරණාද්වයක් පදනම් කොටගෙන මෙකී පූජාව වැදගත් වේ. ඉන් එක් කරණාවක් නම් ස්වකීය රාජකීය උද්‍යානය මේ රටේ මුල්ම බෞද්ධ ආගමික මධ්‍යස්ථානය උදෙසා මිහිඳු මා හිමියන්ට පූජා කිරීමයි. රජු සිය උපරිම උපහාරය හා අනුග්‍රහය නව ආගමට පිදීමට මේ තුළින් උත්සුක වී ඇත. අනෙක් කාරණාව නම් මුල්ම බෞද්ධ ආගමික මධ්‍යස්ථානය ආරම්භ කිරීමට වැගත්ම ස්ථානය මහමෙව්නා උයන බවට රජුගේ පිළිගැනීමක් තිබූ බව ය. මිහිඳු හිමියන් ද එයට පූර්ණ අවකාශය ලබාදුන් බව වංශකතා ගෙනහැර දක්වනු ලැබේ.[2] මේ අනුව මහාමෙව්නා උයන බෞද්ධ මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍යය කරන සියළු අංගෝපාංගයන්ගෙන් සම්පූර්ණ කොට තිබූ බව තහවුරු කෙරේ.

මිහිඳු මාහිමියන්ගේ අනුශාසකත්වය යටතේ දෙවනපෑතිස් රජු විසින් මහාවිහාරයේ සීමා සටහන් කරණු ලැබූ අතර, මිහිඳු මාහිමියන් විසින් උද්‍යානයට ඇතුළත් වියයුතු පූජනීය ගොඩනැගිලි අටමිටක් මල් පුදා සලකුණු කිරීමෙන් පැහැදිලි වන්නේ බෞද්ධාගමික උද්‍යාන සැලැස්මක අන්තර්ගතය පිළිබඳව මිහිඳු මා හිමියන් තුළ මනා වැටහීමක් තිබූ බව ය. පැරණි හෙළ රජදරුවන් විසින්



අනුරාධපුරයේ ඉදිකරණ ලද බෞද්ධ සිද්ධස්ථාන අතුරුන් ප්‍රතිසංස්කරණය වෙමින් පවත්නා අභයගිරය, ජේතවනය හා මිරිසවැටිය යන විශාල දාගැබ්වලිනුත් ථූපාරාමය, රුවන්වැලිසෑය, ඉසුරුමුණිය හා ශ්‍රී මහාබෝධිය යන පූජනීය ස්ථානවලිනුත් නෂ්ටාවශේෂව පවත්නා දක්ෂිණ විහාරය, දළදා මාළිගය, නබාවෙහෙර, පාචිනතිස්ස පබ්බත විහාරය, ලෝවාමහාපාසාදය, විජයාරාමය, වෙස්සගිරිය හා සංඝමිත්තාචෛතිය ආදි පූජනීය ස්ථානයන්ගෙන් අනුරාධපුර නගරයේ ඓතිහාසිකත්වය මැනවින් නිරුපනය වේ. ජගත් කිර්තියට පත් ශ්‍රේෂ්ට කලා කෘතියක් ලෙස විද්වතුන්ගේ පැසසුමට ලක් වී ඇති අභයගිරි විහාර සංකීර්ණයට අයත් සමාධි ප්‍රතිමාවත්, ලොව ඇති ඉපැරණි ඓතිහාසික පූජනීය වෘක්ෂය ලෙස සැලකෙන ශ්‍රී මහා බෝධීන් වහන්සේත්, විශිෂ්ට කලා කෘතියක් ලෙස සම්භාවනාවට පාත්‍ර වූ අභයගිරියේ සඳකඩපහණත් අනුරාධපුරයේ පිහිටා තිබීමෙන් එහි ඓතිහාසික වැදගත්කම දෙගුණ තෙගුණ වී තිබේ.

ථෙරවාදී බුද්ධ ධර්මයේ කේන්ද්‍රස්ථානය වූ ද සිංහල බෞද්ධ සංස්කෘතියේ ප්‍රභවස්ථානය වූ ද අනුරාධපුර මහමෙවුනා උයනෙහි වූ මහාවිහාරයෙහි වර්තමාන කාල සමය වන විට නෂ්ටාවශේෂ සමුහයකට උරුමකම් කියනු ලැබේ. එහෙත් එයට ඇත්තේ වසර දෙදහස් ගණනකට අධික අඛණ්ඩ ඉතිහාසයකි. සියවස් පහළොවක පමණ කාලයක් තුළ අනුරාධපුරය ලංකාවේ රාජධානියව පැවැතිය දී ඉමහත් දියුණුවක් අත්කරගෙන විශ්වකීර්තියට පත් මහාවිහාරය පොළොන්නරු සමයේ දී වුව ද අභාවයට ගියේ නැත. රාජධානිය අනුරාධපුරයෙන් පොළොන්නරුවට මාරු වුව ද අනුරාධපුරයේ ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථානය වූයේ මහාවිහාරයයි. නිදසුනක් ලෙස පළවන විජයබාහු පොළොන්නරුවේ රජවුව ද අනුරාධපුරයට අවුත් අභිෂේක වූ බව සඳහන් වේ.[3] එමනිසාම ලාංකේය බෞද්ධ ජනතාවගේ හදවත් තුළින් මහාවිහාර සංකල්පය බැහැර නොවිය. 13 වන සියවසෙන් පසු අනුරාධරය අභාවයට පත්ව කැලෑවෙන් වැසිගිය පසු නැවැතත් ජනාකීර්ණ වූයේ බ්‍රිතාන්‍යය පාලන සමයේ දී ය. ඒ සමග ම සිද්ධස්ථාන හෙළිපෙහෙළි කිරීම සහ පිළිසකර කිරීමත් ආරම්භ විය. එසේ වුව ද වන ප්‍රවාහය විසින් ගිලගනු ලැබූ මහාවිහාර භූමියෙන් ජනතාවට නිවැරදිව හඳුනාගත හැකි වූයේ

ථූපාරාමය, මහාබෝධිය, මිරිසවැටිය හා ලෝවාමහපාය වැනි ඉතාමත් ප්‍රසිද්ධ සිද්ධස්ථාන කිහිපයක් පමණි. එමනිසාම මහාවිහාරයට අයත්ව තිබූ අනෙකුත් සිද්ධස්ථාන ගැන හෝ මහාවිහාරීය ගොඩනැගිලි පැතිර ගිය සීමාව ගැන හෝ යමක් කිවහැක්කේ අපේ වංශකතා තුළ අතරින් පතර එන තොරතුරු ආශ්‍රයෙන් පමණි.

මහාවිහාරයේ සීමා අධ්‍යයනය කිරීමෙහිලා මහාචාර්ය මලලසේකර මහතාගේ සීමාකථාග්‍රන්ථය ඉතාවැදගත් වුවත්, එය නාමශේෂ වූවක් හෙයින් වංශකතාවන්ට පමණක් එය සීමා වී ඇත. දීපවංශය, මහාවංශය, මහාවංශ ගැටපදයත් මෙහිලා වැදගත් සාධක වේ. මිහිඳු මාහිමියන් ඇතුළු දූත පිරිස ලක්දිවට වැඩම වීමෙන් පසුව බුදුසසුන පිහිට වීම සම්බන්ධ විමසන රජතුමාට ප්‍රකාශ කරණුයේ සීමාවන් පිහිටුවා විනය සංගායානා කරන තෙක් සසුන නොපිහිටන බව මිහිඳු මාහිමියෝ සඳහන් කළහ. පසුව මිහිඳුමහාරහතන් වහන්සේ සමග රජතුමා සීමාවන් ලකුණු කොට සීමාවන් තනා සංඝයාගෙන් අනුමත කොට විනය සංඝයානා කරණ ලද බව සඳහන් වේ.[4]

## මහාවිහාරයේ ඓතිහාසිකත්වය

ලක්දිව ථෙරවාද භික්ෂූන්ගේ ආරම්භක මූලස්ථානය වූ ද හෙළ බොදු සංස්කෘතියේත්, කලා ශිල්ප ආදියේත්, සභ්‍යත්වයේත් ප්‍රභවස්ථානය වූ ද මහාවිහාරය අනුරාධපුර රාජධානියේ විශේෂ ස්ථානයක් ලෙස හැඳින්විය හැක. මෙහි ආරම්භය සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236ක් ගියතැන ලක්දිව අනුරාධපුර නගරයේ මහාමේඝ නම් උයන දෙවනපෑතිස් රජු විසින් මිහිඳු මාහිමියන්ට පූජා කිරීමෙන් ඇරඹුණ බව ඓතිහාසික මූලාශ්‍රවලින් පැහැදිලි වේ.[5] මහාමෙව්නා උයන පිළිගත් මිහිඳු මහාරහතන් වහන්සේ අනතුරුව ලංකාවේ බුදුසසුනෙහි කේන්ද්‍රස්ථානය වන මේ නගරයෙහි පූජනීය ස්ථානයට අවශ්‍යය ගොඩනැගිලි (ආයතන) නිර්මාණයට අවශ්‍යය ස්ථාන පෙන්වා දුන් අතර ඒ අනුව දෙවනපෑතිස් රජු තිස්සමහාරාමාය ආදි ආයතන කරවා පූජාකළ බවත් සඳහන් වේ.[6] දකුණු පසින් වූ නන්දන උයනත් පසුකාලයේ මහාවිහාරයට අයත් බිම් ප්‍රදේශ විය. මිහිඳු හිමියන් ලක්දිවට වැඩම කොට පස්වන දිනයේ තුන්යොදුන් පමණ සීමාව සම්මත කොට[7] ඊට දින දෙකකට පසුව එනම් සත්වන දිනයේ තිස්සමහාරාමයේ පිරිවෙනක් කළ බවත් මැටියෙන් තැනූ



එය පිළිස්සීම නිසා කාලවර්ණ වූ හෙයින් කාලප්පසාද යන නමින් හැඳින්වූ බව සඳහන් වේ. තිස්සමහාරාමයේ මසකට අඩුකාලයක් ගත කළ මිහිඳු මහාහිමියන් ප්‍රධාන භික්ෂූන් වහන්සේලාට වස්විසීම් වස් මිහින්තලයේ කණ්ටක චේතිය ආශ්‍රයෙන් අටසැටක් ලෙන් කරවා පූජාකරවන ලද බව සඳහන් වේ. ඉන් නොබෝ කලකට පසුව මිහිඳු මහාරහතන් වහන්සේගේ අනුශසකත්වය මත ලක්දිව ප්‍රථම ස්ථූපය නිර්මාණය කරණ අතර එය ථූපාරාමය නමින් ප්‍රකට විය. මෙම ථූපයෙහි නිධන් කිරිම සඳහා සුමණ සාමණේරයන් බුදුරජාණන් වහන්සේගේ ධාතුන් වහන්සේලා දඹදිවින් වැඩම කරවූ බවත් මහාවංශය අනාවරණය කරයි. ඒ සමගම දහසක් පුරුෂයින් පැවිදි වූ බවත් සඳහන් වේ. එදිනම චෙතාරි, ද්වාරමණ්ඩල, උපතිස්සගාම ආදි කොට ඇති ගම්වලින් පන්සියය බැගින් පැවිදි වූ බව සඳහන් වේ. මෙයින් මහාවිහාරයේ පිරිස් බලය වර්ධනය වූ අයුරු සඳහන් වේ.

නොබෝ කලකින් සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහා බෝධිය රැගෙන ලංකාවට අටළොස්කුලයක පිරිස් සමග වැඩි බවත් සඳහන් වන අතර ශ්‍රී මහා බෝධිය නගරයේ දකුණු පස දොරටුවට යොදුන් පන්සියයක් ඈතින් රෝපනය කළ බව සඳහන් වේ.[8] ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් හටගත් දෙතිස් අෂ්ටඵල බෝරුක් දිවයිනේ විවිධ ස්ථානවල ද රෝපනය කරණ ලද බව සඳහන් වේ. මෙයින් මහාවිහාරීය ආධිපත්‍යය ව්‍යාප්ත කරන ලද අන්දම ගෙනහැර දක්වයි. අනුලා ඇතුළු රාජකීය කාන්තා පිරිස සසුන්ගත වීමෙන් අනතුරුව මෙරට භික්ෂුණී ශාසනය ආරම්භ වන අතර, ඔහුන්ගේ වාසය පිණිස වාසස්ථාන නිර්මාණය ද ඉන්පසුව සිද්ධ වේ. රජතුමා නුවර එක් පැත්තක උපාසිකා විහාරයක් කළ බව ද සඳහන් වේ.[9] චුල්ලංගන, මහා අංගන, සිරිවඩ්ඩන යැයි ආයතන තුනක් නිර්මාණය කරන ලද බවත් නැවේ කුඹගස තැන්පත් කොට කූපයට්ඨපිත යැයි එක මැදුරක් ද, දෙවැනි මැදුරේ නෞකා දණ්ඩ තැන්පත් කොට ඨපිතඝර යැයි ද, සුක්කානම තැන්පත් කොට අරිත්තඨපිතඝර යැයි ද නම් කළ බව සඳහන් වේ.[10] මෙයට අමතරව හත්ථාලවක මෙහෙණවර කොට රජුට පිළිගන්වන ලද බව ද සඳහන් වේ. වෙස්සගිරිය, ඉසුරුමුණිය, නාගදිවයින, තිස්සමහාවිහාරය හා පාචිනාරාමය රජුගේ තවත් මහාවිහාරාශ්‍රිත නිර්මාණ විය.[11]

මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතාගේ මතය අනුව මහාවිහාර සීමාව ලෙස සඳහන් වන්නේ උතුරින් ථූපාරාමයත්, දකුණින් මයුර පිරිවෙණත්, ගිණිකොණින් ශ්‍රී මහා බෝධියත්, නැගෙනහිරින් ලෝවාමහාප්‍රාසාදයත්, ඊසාන දෙසින් රුවන්වැලිසෑයත් ඇතුළත් වන ලෙසත්, වයඹ දෙසින් බසවක්කුලමත්, බස්නාහිරින් මිරිසවැටි දාගබත්, දකුණින් දක්ඛිණ විහාරයත් මායිම් කොට ඇති ප්‍රදේශයි.[12] ආචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල, මහාචාර්ය ජී. බී. මලලසේකර, මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි යන විද්වතුන් ථූපාරාමය පඤ්ච ආවාසයන්ගෙන් එකක් ලෙස ගෙන මහාවිහාරයෙන් බැහැර කොට ඇත. [13]

## මහාවිහාරයේ උන්නතිය හා පරිහානිය

මහාවිහාරය ආරම්භයත් සමග ම ලංකා ඉතිහාසයේත්, සංස්කෘතියේත්, ජන ජීවිතයේත් විශාල පරිවර්තනයක් වීමනිසා මහාවිහාර ආරම්භය ලංකා ඉතිහාසයේ නව ප්‍රවණතා රැසකට මං පෙත් මන් විවර කිරීමක් ලෙස දැක්විය හැකිය. ලංකාවේ ප්‍රථම සඟසතු කොට කළ උද්‍යාන පූජාව ලෙස සඳහන් වේ. මහාමෙව්නා උයන පිළිගැනීමෙන් අනතුරුව ථෙරවාද බුදුදහමේ මූලස්ථානය වන මහාවිහාරයේ ඒ ඒ තන්හි පිහිට විය යුතු ආරාම අංගෝපාංගයන් හා පූජනීය ස්ථාන පෙන්වා දෙන අන්දම මහාවංශයේ පහොළොස්වන පරිච්ඡේදයේ සවිස්තරව දැක්වේ. එහිදි ස්ථාන පෙන්වාදීමේ දී මාධ්‍යය කොටගෙන ඇත්තේ උයනේ පිහිටි රජමැදුරය. මහාවංශයේ ඉගැන්වෙන ආකාරයට මිහිඳු මාහිමියන් තිස්ස රජුට නිර්මාණය විය යුතු අංග හා ස්ථාන සඳහන් කොට ඇත්තේ පහත ආකාරයට ය.

1. රජමැදුරට දකුණින් පිහිට වූ පිචුල (පුලිල) ගස පිහිටි තැන සංඝකර්ම කිරීමට අවශ්‍යය **සීමා මාලකයට** ද,
2. රජ මැදුරට උතුරින් පොකුණට වැඩම කොට **ගිනිහල් ගෙය** පිහිටුවීම ද,
3. රජ මැදුර දොර කොටුවට වැඩ එහි එක්තරා තැනක් සලකුණු කොට **ජය ශ්‍රී මහා බෝධියේ දකුණු ශාඛාව** පිහිටුවීමට ද,
4. මහමුචල මාලකයට වැඩ සංඝයාගේ **උපෝසථාගාරය** පිහිටුවීමට ද,
5. සංඝයාගේ ලාභයන් බෙදාගන්නා ස්ථානය වන **පැනඹමළුව** පිහිටුවීමට ද,



6. චතුස්සාලා නම් **දාන ශාලා** පිහිටන තැනට ද,
7. රාජ උද්‍යානය ඇතුළත් වූ කකුධ නම් වැව අසල ස්ථානයක් පෙන්වා **මහාථූපය** පිහිටවීමට ද තීරණය කරණ ලදි.[14]

මෙම ස්ථානයන්හි මල් පූජා කිරීමත් සමග පොළව කම්පා වන ලද බව ද සඳහන් වේ. මහාවිහාරයේ වර්ධනීය අවස්ථාව වශයෙන් දුටුගැමුණු රාජ්‍ය සමය හඳුන්වා දීමට පුළුවන. මහානාම හිමියන් තම වංශකතාව වන මහාවංශයේ පරිචය එකොළොසක් වෙන් කොට තිබීම මෙයට කදිම සාධකයකි. මෙයින් දුටුගැමුණු රජු මහාවිහාරයට සිදුකරණ ලද අපරිමිත සේවාව මැනවින් පලට කරයි. මිරිසවැටිය, නවමහල් ලෝවාමහාප්‍රාසාදය, රුවන්වැලිසෑය මෙම රජුගෙන් මහාවිහාරයට හිමි වූ නිර්මාණයන් ය. මෙසේ විවිධ රජවරුන් විසින් විටින්විට තැන වූ ගොඩනැගිලි සියගණනක් මහාවිහාරය සතුවිය. එමනිසාම එය ශීඝ්‍ර වර්ධනයකට ලක්විය. එක් සමයක අනුරාධපුරයේ පිරිවෙන් තුන්සියය සැට හතරක් හා ප්‍රාසාද නවයක් පැවැති බව නිකායසංග්‍රය  දක්වයි. මේ අතරට බුද්ධදාස රජු කළ මොණර පිරිවෙන, සංමෝහවිනොදනීයේ සඳහන් වන පියංගු පිරිවෙන, බුද්ධඝෝස හිමි වැඩසිටි ග්‍රන්ථාකර පිරිවෙන ද අන්තර්ගතය.

ක්‍රි. ව. පළමුවන සියවසේ ආරම්භ වූ අභයගිරිය වට්ටගාමිණී අභය රජු මහාතිස්ස හිමියන්ට පූජාකරන ලදි. මෙය ද මහාවිහාරයට අයත් නිර්මාණයක් වුව ද මහාතිස් හිමියන් පෞද්ගලිකව ම පිළිගැනීම නිසා මහාවිහාරිකයෝ වෙන් වූහ. අනතුරුව මහාවිහාර සම්ප්‍රදාය දෙකඩ විය. මෙම සමයේ අභයගිරිකයන්ට විරුද්ධව ඇති වූ බෞද්ධ මධ්‍යස්ථානය ජේතවනය විය. මෙය හතරවන සියවසේ මහාවිහාර ආසන්නයේ නිර්මාණය වීමනිසා එය මහාවිහාරයට තවත් අභියෝගයක් විය. මෙයම සාගලිකනිකාය නමින් නිකායක් නිර්මාණය වූ ස්ථානය ලෙස ද සඳහන් වේ.

අනුරාධපුර මහාවිහාරය කෙතරම් සම්භාවනීය තත්ත්වයට පත්ව තිබුණේ ද යන්න විමසා බැලීමේ දී මහාවිහාරය පරිහානි යුගයකට ලක්වන විට එම නමින් දිවයිනේ වෙනත් ප්‍රදේශවල ආයතන ආරම්භ වන්නට විය. මහාචාර්යවල්පොල රාහුල හිමි අදහස් කරන ලෙස පාලි රසවාහිනියේ එන අරියගාලතිස්ස නැමැත්තා භික්ෂූන්ට

ආරාධානා කිරීමට මහාවිහාරයට ගිය බව සඳහන් පුවතක් මේ සඳහා නිදසුන් ලෙස ගෙනහැර දක්වනු ලැබේ. මෙහි මහාවිහාරය නමින් හඳුන්වන්නේ තිස්සමහාරාමය බව රාහුල හිමියෝ ප්‍රකාශ කරති. මුල් කාලයේ භික්ෂූන් ලංකාවේ කුමන ප්‍රදේශයක විසුවත් උන්වහන්සේලා ආගමික වශයෙන් අනුරාධපුර මහාවිහාරයට සම්බන්ධව කටයුතු කළ බවත් ආරාම ශාඛා ලෙස එම විහාරයට සම්බන්ධ බවත් ය. මේ සම්බන්ධව තවදුරටත් ප්‍රකාශ කරන රාහුල හිමියෝ ඉතා දුර බැහැර ප්‍රදේශවල සිට මහාවිහාරයට පැමිණි බවත් සඳහන් කරනු ලැබේ.

විවිධ රජවරුන්ගේ අනුග්‍රහය යටතේ වෙහෙර විහාර ගොඩනැගිලි ආගමික වශයෙන් හෝ ශාඛා වශයෙන් මහාවිහාරයට සම්බන්ධ වී තිබීමෙන් මහාවිහාරයේ ව්‍යාප්තිය පෙන්නුම් කෙරේ. එමෙන්ම එය මහාවිහාරයේ ව්‍යාප්තිය පෙන්නුම් කෙරේ. එමෙන්ම එය මහාවිහාරයේ උන්නතිය විදහා දක්වන්නකි. එමෙන්ම මහාවිහාරයෙන් රටපුරා සිදු වූ සේවාව විදහා දැක්වීමක් ලෙස ද ගෙනහැර දැකිවීමට හැකිය. මහාවිහාරය සම්බන්ධයෙන් කතාකරන විට එහි භික්ෂූන්ගේ වර්ධනයත් මහාවිහාරයෙන් වූ සේවයත් අගය කළ යුතු ය. එනිසා කෙටියෙන් වුව ද සඳහන් කිරීම වැදගත් වේ. මහාවිහාරයෙහි වාසය කළ භික්ෂූන් 'මහාවිහාරික' නාමයෙන් හඳුන්වන ලදි. එම භික්ෂූහු සත්‍යවූත් නිර්මල වූත් එකම පරම්පරාවක් ලෙස ගරුසම්මාන ලැබූ බව පාලි අට්ඨකතාවල එන තොරතුරු අනුව පැහැදිලි වේ. පිරිස් බලය මෙන්ම ගොඩනැගිලි අතින් ද මහාවිහාරය වර්ධනව වූ බව ඉතිහාසයෙන් ඔප්පු වේ. මහාවිහාරය ආරම්භයේ 60 නමක් පමණ භික්ෂූන් සිටි බවත් ථූපාරාම ධාතු නිධන් උත්සවයේ දී තිස්දහසක් දක්වා වර්ධනය වී සිටි බවත් මහාවංශය ගෙනහැර දක්වනු ලැබේ.[15] මෙහි සත්‍ය අසත්‍යතාවය කෙසේවුවත් මහාවිහාරය පිරිස් බලය අතින් විශාල වූ බව සඳහන් වේ.

අනුරාධපුර යුගයේ ලක්දිව පැවැති ඉතා වැදගත් වූ ත් සමෘද්ධිමත් වූ ත් සංඝාරාමය වශයෙන් පමණක් නොව ප්‍රධාන අධ්‍යාපන පීඨය වශයෙන් ද මහාවිහාරය උසස් කීර්තියක් හා ප්‍රසිද්ධියක් ඉසිලිය. මජ්ඣිම නිකාය අට්ඨකතාවේ සඳහන් වන අන්දමට එක්තරා භික්ෂුවක් වැරැදි ලෙස අක්ෂර උච්චාරණය කිරීම නිසා මහාවිහාරයට ගොස් නිවැරැදි අක්ෂර උච්චාරණය ඉගෙන ගත් බව සඳහන් කොට



ඇත. මෙයින් පෙනී යන්නේ මහාවිහාරිකයන් සතුව පැවැති විසාරදඥානයයි. අටුවාචාරීන් වහන්සේලා වූ බුද්ධඝෝෂ, ධම්මපාල යන හිමිවරු මහාවිහාර නෛතික සම්ප්‍රදාය පිළිගෙන ඔහුන්ගේ විසාරද දැනුම අගය කරමින් අටුවා රචනා කරන ලද බව සඳහන් වේ. තත්කාලීන උසස් අධ්‍යාපන ආයතනයක් පමණක් නොව එයින් සිදුවූ විශේෂ කරුණු කාරණා රාශියකි. එහි විෂයක්ෂේත්‍රය පුළුල් විය. ධර්මය විනය දෙකට පමණක නොව රාෂ්ට්‍රපාලනය, නීතිය ආදිය පිළිබඳව ද අධ්‍යයන කටයුතු අන්තර්ගත විය. භාතිකාභය රජු මහාවිහාර වාසී ආභිධම්මික ගෝධත්ත තෙරුන්ට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු තනතුරක් ප්‍රධානය කිරීමෙන් මෙ බව තහවුරු වේ.[16] මහාවිහාර භික්ෂූන් අතර ඇතැම් භික්ෂූන් වහන්සේලා විශේෂ පදවීන්ගෙන් පිදුම් ලද බව සඳහන් වේ. විනය පිළිබඳ චූලාභය තෙරුන්ට විශේෂ තැනක් හිමි වූ බැව් සඳහන් වේ. ව්‍යාකරණ, සාහිත්‍යය, ගණිතය, වෛද්‍ය ශාස්ත්‍රය හා නක්ෂස්ත්‍රය යන විෂයන් අන්තර්ගත වූ බව සාරත්ථදීපනීය හා පපඤ්චසූදනීය සඳහන් කෙරේ. අධ්‍යාපන කටයුතුවල දී භික්ෂූන්ගේ ගැටළු විසදාගැනීමට අවශ්‍යය කරන පීඨ ද තිබූ බව සඳහන් වේ. මහාවිහාර අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ පැහැදුනු බොහෝ විදෙස් පිරිස් ද මෙරටට පැමිණියහ. මේ අතර බුද්ධඝෝෂ, ධම්මපාල සම්භාවනීය විද්වතුන් ලෙස සඳහන් කළ හැකිය.

මහාවිහාර සම්ප්‍රදායෙන් සිංහල භාෂාවට සිදුවූ සේවාව අතිවිශාල ය. මෙහිදී මහාවිහාරයෙන් සම්පාදනය වූ හෙළටුවාවන්ට විශේෂස්ථානයක් හිමි වේ. මිහිඳු මාහිමියන්ගේ ශිෂ්‍යයෙකු විසින් රචනා කරන ලද හෙළටුවා සිංහලට්ඨකථා කරනයේ ප්‍රථම නිර්මාණය ද වේ. මහාඅට්ඨකථා, කුරුන්දියට්ඨකථා, මහාපච්චරියට්ඨකථා, අන්ධකටඨකථා හා සංඛේපට්ඨකථා යනුවෙනි.[17] බුද්ධඝෝෂ හිමියන් විසින් මෙම අටුවාවන් පාලියට පරිවර්තනය කළ බවත් ය. නමුත් පශ්චාත් කාලීන ආක්‍රමණ කරන කොට ගෙන මෙම හෙළටුවා විනාශයට ගිය බව සඳහන් විශ්වාස කෙරේ. මහාවිහාරය ආශ්‍රිතව සිදු වූ සුවිශේෂීම සේවාවක් නම් පාලි අටුවා සම්පාදනය කිරීමයි. මෙහිදී බුද්ධඝෝෂ හිමියන් විශාල කාර්යභාරයක් ඉටුකරන ලද බව නොකියාම බැරිය.[18] උන්වහන්සේ මහාවිහාර භික්ෂු පරපුරේ පරීක්ෂණයකට භාජනය විය. එහි දී '' අන්තොජටා බහිජටා,.'' යන බුදු වදන තේමා කොටගත් බුදුවදනට විසුද්ධි මාර්ගය රචනා කොට

උන්වහන්සේ පාලි භාෂාව සම්බන්ධයෙන් විද්වතෙකු බව සනාථ කොට උක්ත අටුවා කරණයට පිවිසි බව වංශකථා ගෙනහැර දක්වයි. මෙහිදී මහාවිහාරවාසී සංඝපාල තෙරණුවෝ ඉමහත් කාර්යභාරයක් ඉෂ්ට සිද්ධ කරන ලදි. බුද්ධඝෝෂ හිමියන්ගෙන් පසු ආචාර්ය ධම්මපාල හිමියන් අටුවාකරණයෙහි උත්සුක වන ලදි. මේ තුළින් ගම්‍යමාන වනුයේ පාලි භාෂාවේ මතු උන්නතිය පතා මහාවිහාරිකයින් ඉමහත් කාර්යභාරයක් ඉටුකරන ලද බවත් ය.

මහාවිහාරිකයින්ගෙන් සිදු වූ ශ්‍රේෂ්ඨතම කාර්යභාරය වනුයේ මාතලේ අළුවිහාරයේ දී ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම ය. බැමිණිතියාසාය හා වෙනත් උවදුරු පිළිබඳ මෙනෙහි කොට අනාගතයෙහි ධර්මයෙහි සුරක්ෂිතභාවය පතා මාතලේ අළුවිහාරයේ දී ධර්ම ග්‍රන්ථාරූඪ කරන ලද බවයි. මෙහි ප්‍රතිඵලය වර්තමානය දක්වා ද දිව එන බව සඳහන් කළ යුතුම ය. භාණක පරම්පරා මගින් සුරක්ෂිත කරගත් ධර්මය මෙලෙස ග්‍රන්ථාරූඪ වූ බව ඓතිහාසික වාර්තා සනාථ කරයි. පාලි සාහිත්‍යයේ ද අනාගත ස්ථාවරත්වයට මෙතරම් බලපාන ලද තවත් කාර්යයක් නොමැති තරම් ය.[19] ථේරවාදී බුදුසමය සුරක්ෂිත කරගැනීමෙහිලා මහාවිහාරික භික්ෂූන් වහන්සේලා සුවිශේෂී කාර්යභාරයක් ඉෂ්ටසිද්ධ කළහ. මෙහිදී වෝහාරිකතිස්ස, ගෝඨාභය, මහසෙන් වැනි රජවරුන්ගේ කාලසමයන්හි ඇති වූ වෛතුල්‍යවාදී බලපෑම්වල දී මහාවිහාරික භික්ෂූන් වහන්සේලාට දානමාන නොලැබුන ද ස්ථිර ප්‍රතිපත්තියේ සිට ලෝවාමහාප්‍රාසාදයට රැස්ව තම ථේරවාද ධර්මයේ සුරක්ෂිතතාවය පතා රුහුණට අවුත් තම සම්ප්‍රදාය ආරක්ෂා කරන ලද අන්දමත්, තත් මහාවිහාරිකයන්ගේ ධර්මශාස්ත්‍රීය සේවාවෙහි ප්‍රදීපලයක් ලෙස නම් කළ හැක. මහාවිහාරය හා අභයගිරිය අතර දිගුකලක් ගතවන තුරු ම ධර්මවිනය සම්බන්ධයෙන් ගැටළුවක් නොවූ බවත්, සමන්තපාසාදිකාව සඳහන් කරන ආකාරයට භාතිකාභය රජු දවස සිදුවන ලද මතභේදයන් මත මෙම බෙදීම සිදු වූ බවයි. මේ සඳහා පරීක්ෂණ කටයුතු පැවැත්වීමට භාෂාශාස්ත්‍රය පිළිබඳ නිපුණයකු වූ දීඝකාරායන නම් බ්‍රාහ්මණ ඇමැතියා පත්කරන ලද බව සඳහන් වේ.[20] මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ඊ. ඩබ්ලිව්. අධිකාරම් මහතා ප්‍රකාශ කරනුයේ මෙම උභය පාර්ශවය අතර ධර්ම විනය පිළිබඳ ගැටළුවක් නොවූබවත් ඇතිවූයේ භාෂාමය ගැටළුවක් බවත් ය.[21] නමුත් මෙහි



වර්ධනීය ස්වරූපය දක්නට ලැබෙනුයේ වෝහාරිකතිස්ස රජු දවස සිදු වූ වෛතුල්‍යවාදී ආකල්පයි.[22] මේ අනුව මහාවිහාරිකයන් වෛතුල්‍යවාදී ධර්ම කොටස් අධ්‍යයනය කොට ඒවා නිවැරදි බුද්ධ භාෂිත නොවන බව තීරණය කොට ගිනිබත් කොට විනාශ කිරීමට පවා පෙළඹුන බව ඓතිහාසික වාර්තා අනාවරණය කෙරේ. මෙකී අදහස් තුළින් ගම්‍යවන්නේ මහාවිහාරික භික්ෂු පරම්පරාව කෙතරම් දුරට තම ආගමික දාර්ශනික හරය තහවුරු කරගැනීමට හා සුරක්ෂිත කර ගැනීමට උත්සහාගන්නා ලද්දේ ද යන්නයි.

අභයගිරිය ආශ්‍රිතව ගොඩනැගුණු පූජා සංකල්ප බැහැර කිරීමට ද මහාවිහාරිකයන් බසුබට නොවීය. බෞද්ධයින්ගේ අතිඋත්තම පූජනීය වස්තුවක් වූ දළදාව ද පිළිගැනීමට ඔහු කැමැති නොවීය. මෙහිදී දළදාව ආශ්‍රිතව සිදු වූ පූජාවන්ට ද මහාවිහාරිකයන් සහභාගී වීම ප්‍රතික්ෂේප කරන ලදි. මහාවිහාරිකයන් පුදසිරිත්වලට වඩා ප්‍රතිපත්තිය උතුම් කොට සලකූහ. මේ අනුව මහාවිහාරිකයෝ උක්ත සංකල්ප බැහැරකරන්නට වූහ යනු විද්වත් මතයයි. මේ සම්බන්ධව අදහස් දක්වනවල්පොළ රාහුල හිමියෝ ප්‍රකාශ කරනුයේ මෙයට වඩා ප්‍රබල කාරණයක් බලපාන්නට ඇතය යන්නයි. එනම් මහාවිහාරිකයින් හේමමාලා දන්තකුමරු දෙදෙන මහායාන බෞද්ධයින් ලෙස සැලකීම යන්න ය.[23]

එනමුත් මෙම අවධිය වන විට මහාවිහාරය පරිහානිය සමයකට පත්ව තිබූ බව වංශකතා තොරතුරුවලින් අනාවරණය වේ. මහාවිහාරයේ 3000ක් පමණ භික්ෂූන් වහන්සේලා වැඩසිට අතර, අභයගිරියේ 5000 ක් පමණ භික්ෂූන් මෙම යුගයේ විසූබව සඳහන් වේ. මේ බව ෆාහියන් වාර්තාවන්හි ද සඳහන් කෙරේ. අභයගිරියේ භක්තිමත් දායකයෙකු වූ මහනාම රජු තම දේවියගේ ඉල්ලීම අනුව අභයගිරිය සම්බන්ධ පිරිවෙන් රාශියක් ද නිර්මාණය කෙරේ. මෙම පදනම මත පිහිටා මහාවිහාරිකයින් හෙළටුවා පාලියට පෙරළීමට උත්සහා ගන්නා ලද බව ද ඇතැම් විද්වතුන්ගේ ආකල්පයයි.

මෙලෙස විවිධ අවස්ථාවන්හි විවිධ ආක්‍රමණ හා රාජතාන්ත්‍රික උදහස්වලට එරෙහිව නැගිසිටි මහාවිහාරික භික්ෂූහූ ඉතා දීර්ඝ කාලයක් පුරා තම අනන්‍යතාවය ආරක්ෂා කරගනු වස් ඉමහත්

පරිත්‍යාගයක් සිදු කරන ලද බව නොකියාම බැරිය. එහි දක්නට ලැබෙන ප්‍රතිඵලය නම් බාධක හා කම්කටොලු මද්‍යයේ මහාවිහාරික භික්ෂූන් ජාතික ආගමික ප්‍රබෝධය පතා සුවිශේෂී කාර්යභායක් ඉතා නොමසුරුව ඉටුකරන ලද බවත් ය.

**ආන්තික සටහන්:**

1 දීපවංශය, කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 15 වන පරිච්ඡේදය, 67-68 පිටු, 1959.
2 The Mahavamsa, Wilhelm Geiger,PTS, Chapter XV, 2 - 3 Stanza, 97p, 1912.
3 -එම-, Chapter XV- 27 - 56 Stanzas, 99-101p.
4 දීපවංශය, කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 15 වන පරිච්ඡේදය, 14- 15 ගාථා, 73-74 පිටු, 1959.
The Mahavamsa, Wilhelm Geiger, PTS, Chapter XV, 78- 80 Stanzas, 103-104p, 1912.
5 The Mahavamsa, Wilhelm Geiger, PTS, Chapter XVII, 178- 209 Stanzas, 110-214p, 1912.
6 -එම-, Chapter XV, 43 - 53 Stanzas, 100-101p.
7 දීපවංශය, කිරිඇල්ලේ ඥාණවිමල හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 14 වන පරිච්ඡේදය, 15- 24 ගාථා, 68-69 පිටු, 1959.
The Mahavamsa, Wilhelm Geiger, PTS, Chapter XV, 78- 80 Stanzas, 103-104p, 1912.
8 The Mahavamsa, Wilhelm Geiger, PTS, Chapter XVIII, 19- 21 Stanzas, 123p, 1912.
9 -එම-, Chapter XIX, 76 - 82 Stanzas, 134-135p.
10 -එම-, Chapter XX, 02 - 07 Stanzas, 136p.
11 -එම-, Chapter XXXV, 31 Stanza, 249p.
12 අනුරාධපුර මහාවිහාරය, වසන්ත සංජීව හෙට්ටිආරච්චි, ශ්‍රී ලංකා සංස්කෘතික පර්යේෂණ ආයතනය, 8 පිටුව, 1996.
13 -එම-, 09 පිටුව.
14 අපේ සංස්කෘතිය, සංස්කෘතික හා ආගමික නටයුතු අමාත්‍යාංහය, විමල විජේසූරිය, මහාවිහාරයේ ආරම්භය සහ මහාවිහාර සම්ප්‍රදාය, 85 පිටුව, 1995.
15 The Mahavamsa, Wilhelm Geiger, PTS, Chapter XIV, 17- 20 Stanzas, 92p, 1912.
16 පපංචසූධනී, 823 පිටුව.
17 සමන්තපාසාදිකා විනයට්ඨකථා, ප්‍රථම භාගය, අම්බලන්ගොඩ ධම්මකුසල මහානායක ස්ථවිර සිංහල පරිවර්තනය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, xxxi පිටුව, 2009.
18 -එම-, xxxiv පිටුව.



19 -එම-, xxxii-xxxiii පිටුව.
20 සමන්තපාසාදිකා විනයට්ඨකථා, තෙවන භාගය, අම්බලන්ගොඩ ධම්මකුසල මහානායක ස්ථවිර සිංහල පරිවර්තනය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 582-583පිටුව, 2009.
21 පැරැණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, ඊ. ඩබ්ලිව්. අධිකාරම්, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 208 පිටුව, 2003.
22 ලක්දිව බුදුසමයේ ඉතිහාසය,වල්පොළ රාහුල හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 91 පිටුව, 1999.
23 -එම-,

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:**


අධිකාරම් ඊ. ඩබ්ලිව්. **පැරැණි ලක්දිව බෞද්ධ ඉතිහාසය**, කේ. ජී. ජයවර්ධන සමාගම, 1969.

ධම්මකුසල අම්බලන්ගොඩ, මහානායක ස්ථවිර **සමන්තපාසාදිකා විනයට්ඨකථා**, ප්‍රථම භාගය, සිංහල පරිවර්තනය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2009.

ඥාණවිමල හිමි කිරිඇල්ලේ, **දීපවංශය**, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959.

රාහුල හිමිවල්පොළ, **ලක්දිව බුදුසමයේ ඉතිහාසය**,වල්පොළ රාහුල හිමි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 91 පිටුව, 1999.

**ලක්දිව අධ්‍යාපන සියවස් ප්‍රකාශනය**, පළමු කාණ්ඩය, 1965.

විජේසූරිය විමල, **අපේ සංස්කෘතිය**, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, 1995.

සාරානන්ද හිමි දුනුකේඋල්ලේ, **ධර්මරුචි සම්ප්‍රදාය තදනුබද්ධ අධ්‍යාපන ආයතන පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්**, වයි. එන්. ප්‍රින්ටර්ස්, 2004.

හෙට්ටිආරච්චි වසන්ත සංජීව, **අනුරාධපුර මහාවිහාරය**, ශ්‍රී ලංකා සංස්කෘතික පර්යේෂණ ආයතනය, 8 පිටුව, 1996.

Wilhelm Geiger, **The Mahavamsa**, PTS, 1912.